
**දෙවන වාර පරීක්ෂණය 2020 - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | - 4 | (11) | - 5 | (21) | - 4 | (31) | - 1 |
| (02) | - 2 | (12) | - 4 | (22) | - 2 | (32) | - 3 |
| (03) | - 4 | (13) | - 4 | (23) | - 4 | (33) | - 4 |
| (04) | - 4 | (14) | - 4 | (24) | - 2 | (34) | - 5 |
| (05) | - 4 | (15) | - 3 | (25) | - 4 | (35) | - 2 |
| (06) | - 3 | (16) | - 1 | (26) | - 4 | (36) | - 2 |
| (07) | - 4 | (17) | - 4 | (27) | - 2 | (37) | - 1 |
| (08) | - 5 | (18) | - 3 | (28) | - 5 | (38) | - 4 |
| (09) | - 4 | (19) | - 2 | (29) | - 4 | (39) | - 3 |
| (10) | - 4 | (20) | - 4 | (30) | - 5 | (40) | - 5 |

(ලකුණු 40)

<u>11 පත්‍රය - පිළිතුරු</u>




## II පත්‍රය

01. සිතියම - සිතියම ලකුණු කර ඇති ආකාරයට අනුව ලකුණු ලබාදෙන්න. (ල. 12)

**B කොටස**

02. 1. ගංගා පද්ධතිය : සින්දු, නර්මදා, තප්ති, බ්‍රහ්මපුත්‍ර, යමුනා, ගංගා නම් ගඟ, මහානදිය, ගෝධාවරී, ක්‍රිෂ්ණ තුංගං භද්‍ර, කාවේරි ආදී ගංගා.
    2. දුර්ග මාර්ග : ඛයිබර්, බෝලාන්, මක්‍රාන්, හේරත්,ආදී දුර්ග මාර්ග.
    3. කඳුවැටි : හිමාලයා, හින්දුකුෂ්, වින්ධ්‍යා, සත්පුර, අරවල්ලි, නැගෙනහිර සාට්ස්, බටහිර සාට්ස් ආදී කඳුවැටියන්.
    4. කාන්තර හා සානු : ථාර් කාන්තාරය, ඩෙකැන් සානුව ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

03. (i) මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තෘණ භූමි ප්‍රදේශය. (ල. 1)

(ii) වෛදික යුගයේ - සින්දු ගග - පශ්චාත් වෛදික යුගයේ - ගංගා නම් ගග (ල. 2)

(iii) යජුර්, සාම, අතර්වන්, බ්‍රාහ්මණ, උපනිශද් (ල. 2)

(iv) පශ්චාත් වෛදික යුගයේ සමාජ ලක්ෂණ :

* ගෝත්‍රික සමාජය තවදුරටත් ස්ථාවර තත්වයට පත්වීම. * බ්‍රාහ්මණ බලය බෙහෙවින් වර්ධනය වීම.
* ක්ෂත්‍රියයන් රාජ්‍ය පාලනයත්, වෛශ්‍යයින් ගොවිතැන හා වෙළඳාමක්. ශුද්‍රයන් ඉහළ කුලවල සේවා කිරීමත් සිදුවීම.
* සමාජය කුලවලට බෙදී තිබීම.
* බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි යන වර්ණාශ්‍රම ධර්ම මගින් සමාජය හැඩගැස්වීම.
* කාන්තාවන්ට තිබූ නිදහස වේගයෙන් අහිමි වී යෑම.
* ඒක භාර්‍යාමෙන්ම බහු භාර්යා සේවනයද දක්නට ලැබීම.
* ඇඳුම් පැළඳුම් ඍග් වෛදික යුගයේ පැවති තත්වයෙන් යම් යම් වෙනස්කම් සිදුවීම.
* විනෝදාංශ ලෙස ගායනය, වාදනය, නර්තනය, දූකෙළිය, රිය ධාවනය පැවතීම.
* ආහාර රටාව ඍග් වෛදික යුගයේ මෙන්ම පැවතීම. (ආදිය විස්තර කරන්න) (ල. 4)

(v) **<u>ඍග් වෛදික යුගය</u>**

* ස්වභාවික වස්තූන්ට, බලවේගයන්ට දේවත්වයක් ආරෝපණය කොට වන්දනා කිරීම.
* බහුදේවවාදී ආගමික රටාවක් ඉස්මතු වීම.
* මෙම දේව පිරිස් ප්‍රධාන කොටස් 3කට බෙදා තිබීහ. ඒවා ආකාශ, අනතරීක්ෂ, පෘථිවි. ලෙස බෙදා තිබීම.
* එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම.
  උදා : ඉන්ද්‍ර - ශක්තිය, වැස්ස, මේඝ, ගර්ජන ආදියට අධිපති.
  වරුණ - ජලයට, ශාක හා සත්ත්ව ජීවිතපවත්වාගෙන යාමට ආදී වශයෙන්.
* බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රාවනයක් වූ සෝමපානය සෝම දෙවියා ලෙස වන්දනයට පාත්‍ර වීම.
* වෛදික දෙවිවරුන් පිදීමට ඍග් වේදයේ විවිධ ස්තෝත්‍ර ගීතිකා 1028 කින් වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබීම.
* යාඥය නම් වූ ආගමික කාර්ය ඉතා කුඩාවට ''ගෘහ යාග'' ලෙස මෙකල ආරම්භ වීම.
* දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැද දෙවියා ලෙස අග්නි දෙවියා වැදගත් වීම.
* මෙම ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වීමෙන් පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්වය වර්ධනය වීම.

**<u>පශ්චාත් වෛදික යුගය :</u>**

* ඍග් වෛදික ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වී බහුදේවවාදය ඒක දේවවාදයක් බවට පත් වීම.
* ඍග් වෛදික පැරනි දෙවිවරුන් රාශියකගේ බලවත් බවනැති වී ඔවුන් නොවැදගත් තත්වයට පත්වීම.
* විෂ්ණු, ඊශ්වර, බ්‍රාහ්ම යන දෙවිවරුන් (ත්‍රි මූර්තිය) ජනප්‍රිය සංකල්පයක් බවට පත්වීම.
* සරල යාග සංකීර්ණ යාග බවට පත්වීම.
* සරල ගෘහ යාග මහා යාග වී සතුන් පමණක් නොව මිනිසුන් ද බිලිදීම තෙක් වර්ධනය වීම.
* බ්‍රාහ්මණයාගේ තත්වය ඉහළ යැමනිසා ඔහු ''භූසුරු'' නමින් හැඳින්වීම.
* දෙවිවරුන්ගේ සේවකපිරිසක් ලෙස බ්‍රාහ්මණයන් ක්‍රියා කිරීම.
* ආරණ්‍යක හා උපනිශදිවැනි යුගයක් කරා එළඹීමත් සමග බ්‍රාහ්මණ සංකල්පයට එරෙහිව ශ්‍රමණ සම්ප්‍රදායක් ඉස්මතු වීම.
* පසු කලෙකදි බ්‍රාහ්මණ බලය පිරිහී ධ්‍යාන වඩන තවුසන්ට ප්‍රමුඛත්වය ලැබීම.
* ක්ෂත්‍රියයන් උපනිෂද් දර්ශනයේ පුරෝගාමීන් වීම.
* මේ පසුබිම මගින් පසුකාලීනව දාර්ශනික හා ආගමික මතවාද රාශියක් ඉස්මතුවීම.
* බුදුන් වහන්සේගේ දර්ශනයට පවා බලපෑමේ උපනිශද් දර්ශනයයි. ආදී විස්තර කරන්න. (ල. 7)

04. (i) දයාරාම් ශානි, මෝටිමර්වීලර්, වසන්ත් සින්ද්, ඒ සෝෂ්, එම්.එස්. වත්ස්, ආර්.ඩී. බැනර්ජි, ජෝන් මාෂල්, මැකේ. (ල. 2)

(ii) හරප්පා. මොහොන්ජොදාරො, රබීගාර්හි. (ල. 2)

(iii) ජගත් මාතා වන්දනය, වෘක්ෂ වන්දනය, ජලවන්දනය ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 4)

(iv) නාගරික ලක්ෂණ : නිවාස පද්ධතිය ඇතුළු නගරය, හරප්පාවේ ධාන්‍යාගාරය, මොහොන්ජොදාරෝවේ ස්නානාගාරය, ආලෝක කුලුණු, රබීගාර්හි විශාල ස්නානාගාරය, දියුණුව නාගරික සැලසුම් රබීගාර්හිවලිත හමුවීම ආදිය විස්තර කරන්න. (ල. 8)

05. (i) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර

* ශ්‍රී ලංකාවේ මූලාශ්‍ර - දීප වංශය, මහා වංශය, සමන්තපාසාදිකා.
* ග්‍රීක මූලාශ්‍ර - මෙගස්තිනිස්, හෙරඩෝටස්, ස්ට්‍රාබෝ, ජස්ටින් පෙරිප්ලස් ඔෆ් එරිත්‍රියන් වී යන ග්‍රන්ථ.
* රෝම මූලාශ්‍ර - ප්ලිනිගේ නැචුරාලිස හිස්ටෝරියා, ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය.
* චීන මූලාශ්‍ර - පාහියං වාර්තා, හ්‍යුංසාං වාර්තා, ඉත්සිං වාර්තා.
* ටිබෙට් මූලාශ්‍ර - ඇල්බිරූනි, අල්මසූදි, ඉබන් කුර්දාද්, ඉබන් ෂහිරිහාන් තාරානාථයින්ගේ වාර්තා
* කැපී පෙනෙන විදේශීය මූලාශ්‍ර ලෙස මෙගස්තිනියගේ ඉන්ඩිකා, හියුංසාං ගේ වාර්තා වැදගත් වීම ආදිය විස්තර කරන්න.

(ii) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

(iii) මගධ - අධිරාජ්‍ය - ඉන්දියාවේ සොළොස් මහා ජනපද අතරින් මගධය අනෙක් ජනපද අභිබවා ඉදිරියට ඉදිරියට ඒම එහි පාලකයා බිම්බිසාර රජු වීම. ඔහු තම රාජ්‍ය අධිරාජ්‍ය තත්වයට ගෙන ඒම තෙක් අනුගමනය කළ සටන් විවාහ මත්ස්‍ය න්‍යාය ආගමික සහනශීලි ප්‍රතිපත්තිය ආදිය විස්තර කරන්න.

(iv) නාණක මූලාශ්‍ර ඉන්දියාවේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතර නාණක මූලාශ්‍රවලට වැදගත් තැනක් හිමිවීම.

* වෙළඳම, ආර්ථික තත්වය, ජන ජීවිතය ආක්‍රමණ, රාජධානි බිඳ වැටීම ආදී තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිවීම.
* කාසිවල සඳහන් රූප සටහන්, සංකේත සහ පාඨ ආදිය මගින් ඒවා නිකුත් කළ රජුන්, ප්‍රධානීන් වෙළඳ ශ්‍රේණි නාගරිකයන් ගැන තොරතුරු ලැබීම.
* රන්, රිදී, තඹ ලෝකඩ ආදී යොදාගත් මාධ්‍ය අනූන තත්කාලීන ආර්ථික තත්වයේ ස්වරූපය අනාවරණය වීම.
* ඉන්දියාවෙන් සොයාගත් කාසි ලෙස,
* බැක්ට්‍රියානු ග්‍රීක කාසි - රජවරු 30 දෙනෙකුපිළිබඳ තොරතුරු ලැබේ.
* දියඩෝටස්ට අයත් රන් කාසි.
* කුෂාණ කාසි - කණිෂ්ක රජුටඅයත් රන්කාසි
* ගුප්ත කාසි - මේ යුගයේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික තොරතුරු රැසක් මෙමගින් හෙළි වීම.
* සමුද්‍රගුප්ත රජුට අයත් කාසි.
* ගණ රාජ්‍යයන්ට අයති කාසි - ආදිය විස්තර කරන්න. එක් කොටසකට ලකුණු 8බැගින්)

## C කොටස

06. (i) මුල්ම පාලකයා - කුජුල කැඩ්පයිසීස් - ඔහුගෙන් පසු - හීම කැඩ්පයිසීස්. (ල. 2)

(ii) මුල් බිම - චීන තුර්කිස්ථාන ප්‍රදේශය. - ගෝත්‍රය - යූ - ඒ - චි නම් එඬේර ගෝත්‍රය (ල. 2)

(iii) ආගමික හා සංස්කෘතික වැදගත්කම.

* කුෂාණයන් විදේශීයප්‍රභාවය ලැබූ රාජවංශයක්වූවත් ඉන්දීය සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම.
* කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම.
* මේ සංගායනාවේ වැදගත් ප්‍රතිඵල රැසක් සිදුවීම. සූත්‍ර විභාෂ, විනය විභාෂා. අභිධර්ම විභාෂා ලෙස මහායාන ත්‍රිපිටකයක් නිර්මාණය වීම.
* මහායානබුදු දහමේ වර්ධනය. * බෝධිසත්ව සංකල්පය ප්‍රචලිත වීම.
* බෞද්ධ ප්‍රතිමා නිර්මාණය ඇරඹීම. * බෞද්ධ ගොඩනැගිලි විහාරාම හා ස්ථාන ඉදිවීම.
* සංස්කෘත භාෂාවට විශේෂ තැනක් හිමිවීම සංස්කෘත භාෂාවෙන්කෘති ලිවීම.
* මෙම යුගයේ ශ්‍රේෂ්ඨ ගත්කතුවරු බිහිවීමත අශ්වඝෝෂ නාගර්ජුන, වසුබන්ධු, පාර්ශවවැනි.
* ගාන්ධාර, මධුරා න කලා සම්ප්‍රදායයන් දියුණු වීම ආදිය විස්තරකරන්න. (ල. 4)

(iv) **<u>දේශපාලන කාර්ය :</u>**

* උත්තර ප්‍රදේශයේ සිට මාල්වා හරහා කතිවාර් තෙක් ඔහුගේ බලය ව්‍යාප්තව පැවතීම.
* පුරුෂපුරය (පෙෂාවෝර්) අගනගරය කරගෙන අධිරාජයක් පිහිටුවීම.
* මධ්‍ය ආසියානු ප්‍රදේශවල බලය ව්‍යාප්තිය.
* කණිෂ්කගේ නැගෙනහිර ඉන්දීය බලව්‍යාප්තිය ටිබෙට් හා චීන ලේඛනවැදගත් වේ. මේ අනුව පාඨලීපුත්‍ර, බෙංගාලය, ඔරිස්සා, බිහාරිය, නේපාලය තෙක්ඔහුසිය බලය ව්‍යාප්ත කළ බව.
* පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී නම් ග්‍රන්ථයේ 'සන්දනෙස් නම් රජකු බටහිර ඉන්දියානු ප්‍රදේශ ජයගෙන ඇත. සන්දනෙස් ලෙස දක්වා ඇත්තේ කනිෂ්කරජු බව අනුමාන කිරීම බටහිර ඉන්දියාවේ හාරුකච්ඡ හා කතියවාරය යන ප්‍රදේශවල බලය ව්‍යාප්ත කොට ඇත.
  ආදී තොරතුරු විස්තර කරන්න. (ල. 8)

07. (i) සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්ය,

* මොහු පිළිබඳව හැදෑරීමට ඇති ප්‍රධානතම ලේඛනය හිසේන කවියාගේ අලහබාද් ප්‍රශස්තියයි. මෙයට අමතර එරාන් සහ ගයා යන ස්ථානදෙකේ ප්‍රධාන සෙල්ලිපි දෙකක් පිහිටුවා ඇත.
* අලහබාද් ප්‍රශස්තියට අනුව I වන චන්ද්‍රගුප්ත රජු විසින් සිය පුත්‍ර සමුද්‍රගුප්තයන්ට රාජ්‍යභාරදීම
* සමුද්‍රගුප්ත රජුගේ බල ව්‍යාප්තියඅදියර 4ක්යටතේ සිදුවීම.
* ආර්යාවර්තය ජය ගැනීම, අටවික රාජ්‍යජය ගැනීම, දක්ෂිණාපථය ජය ගැනීම, දේශසීමාබද රාජ්‍ය ජය ගැනීම.
* සමුද්‍රගුප්ත රජු රටවනවිට ගුප්ත රාජ්‍ය ප්‍රාදේශීයබලයක් පමණක් හිමිකරගෙන සිටීම.
* පාඨලිපුත්‍රය අගනගරයකර ගනිමින් දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කළ සමුද්‍රගුප්ත රජු අිසැමය, බෙංගාලය. පංජාබය, ඩෙකෑනය පසුකරමින් කාංචියතෙක් මාල්වා, කතියවාර්, දක්වාද සිය බලය ව්‍යාප්ත කළේය.
* නිශ්චිත ප්‍රවේශයක් පමණක් පාඨලීපුත්‍රයේ සිය පාලනය කරමින් සෙසු අසල්වැසි රාජ්‍යයෙන් පුද පඬුරු හා දූත ගමන් මගින් අවනතකරවා ගැනීම.
* ආර්යාවෘත්තයේ රජවරුන් 9 දෙනෙකු යටත් කර ගැනීම.
* ප්‍රත්‍යන්ත රාජ්‍ය 9ක් යටත්කර ගැනීම.

* සමුද්‍රගුප්ත රජුගේ ප්‍රධාන ලේඛන 3කි. (ප්‍රයාග, ඒරණ, ගයා)
* අශ්වමේධ යාග 2ක් පැවැත්වූ බවසඳහන් වීම. රජුට සටන් සියයක වීරයා යන අභිධානය ලබාදී තිබීම.
* අධිරාජයා නිකුත් කළ විවිධ කාසි ඔහුගේ රණකාමිත්වය, දේශපාලන ආධිපත්‍යය, ආර්ථික සමෘද්ධිය විදහා දැක්වීම.
* සමුද්‍රගුප්ත ශාස්ත්‍රයෙහි මනා නිපුණයෙක් වීම. ප්‍රශස්තිකරුවා කවිරාජ යන විරුධයෙන් මොහු හැඳින්වීම. (විස්තර කරන්න) (ල. 16)

08. (i) වලභියේ මෛත්‍රිකයෝ. * තෞජයේ මෞරීවරු. * ථානේශ්වරයේ පුෂ්‍යභූතිවරු.

(ii) * හර්ෂවර්ධන රජු අයත් රාජ වංශය - පුෂ්‍යභූති රාජවංශ්‍ය
* ඔහුගේ තොරතුරු සපයනමූලාශ්‍රය - බානභට්ටගේ හර්ෂ චරිතය, හියුංසාංගේ වාර්තා. (ල. 2)

(iii) **<u>ආගමික හා සාහිත්‍යය :</u>**
* ආගමික සහනශීලීප්‍රතිප්තතිය. * පංච වාර්ෂික මහා දානයක් පිරිනැමීම.
* කනෞජ් හා ප්‍රයාග ආගමිකසම්මේලන පැවැත්වීම.
* ස්ථූප හා විහාර ගොඩනැංවීම. * බුද්ධිමතුන්ට අනුග්‍රහ දැක්වීම.
* රාජ්‍ය ආදායමෙන් 1/4 ක් ලේඛකයන්ට පිරිනැමීම.
* නාලන්දා, තක්ෂිලා වලභිවැනිඅධ්‍යාපන මධ්‍යස්ථානවලට අනුග්‍රහ දැක්වීම.
* රජු ග්‍රන්ථකරණයේ නියැලීම. (රත්නාවලී ප්‍රියදර්ශිකා නාගානන්ද)
* රජුගේඅනුග්‍රහය නිසා විද්වතුන් විසින් සාහිත්‍යය කෘති රචනා කිරීම ආදිය විස්තර කරන්න. (ල. 4)

(iv) දේශපාලන කටයුතු :
* වලභි හා ගුර්ජර පාලකයන් සමග සටන් කිරීම.
* වාතාපියේ බටහිර දාලුක්‍යයන් සමග සටන්කිරීම.
* සින්ධු ප්‍රදේශය සමග සටන් කිරීම.
* නැගෙනහිර ඉන්දියාවේ අවුද්, කොංගෝද රාජ්‍ය සමග සටන් කිරීම.
* ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසන් පාලකයා වීම.
* කනෞජට මුල් කොටගෙනපාලනය මෙහෙයවීම.
* සංවිධානාත්මක රාජ්‍ය පරිපාලන තන්ත්‍රයක් ගොඩනැගීම.
* චීනයත් සමග සම්බන්ධතාපැවැත්වීම.
* සකල උත්තරාපතනාථ යන නාමයෙන් හර්ෂ රජු, සිය සතුරා වන දෙවන පුලකේශීන් සිය අයිහෝල් අභිලේඛනයේ හඳුන්වා ඇත.
* විශාල වැඩ කොටසක් කළපාලකයෙකු වුවත් මූලාශ්‍ර හිඟකම නිසා ඉතිහාසය තුළ ඔහුට නිවැරදි තක්සේරුවක් ලැබීනැත. ආදී තොරතුරු විස්තර කරන්න. (ල. 8)

09. (i) ගුප්ත යුගයේ සංස්කෘතිය - ගුප්ත යුගයේ සංස්කෘතිය තේමා කීපයක් යටතේ විග්‍රහ කළ හැකිය.
* ආගමික ප්‍රබෝධය * වාස්තු විද්‍යාව * මූර්ති කලාව හා චිත්‍ර කලාව
* අධ්‍යාපන හා සාහිත්‍යය යන අංශ යටතේ විස්තර කරන්න.

(ii) සාතවාහන යුගයේ සංස්කෘතිය :
* ඉන්දියාව දක්ෂිණාපථයේ සංස්කෘතික අභිවර්ධණයක් ඇතිකළ සුවිශේෂ රාජ වංශයක් වීම.
* ගෘහනිර්මාණ ශිල්පීය දියුණුවීම.
* පිහිටිගල ඇතුළට හාරා චෛත්‍යය ශාලා හා විහාර ගෙවල් ඉදි කිරීම.
* ඩෙකැනයේ ඇති විශිෂ්ඨ වාස්තු විද්‍යාත්මකලක්ෂණ පෙන්නුම් කරන ලෙන් කිහිපයක් ඉදිකිරීම. භාජා, බෙද්සා, කාර්ලේ, ජුන්නාර්, නාසික්, තන්හේරි, අජන්තා ලෙන්.
* බොහෝ ලෙන් බෞද්ධ භික්ෂූන්ට පූජාකිරීම. බ්‍රාහ්මණයන් හා ජෛනයන් සඳහා ද ලෙන් පූජාකිරීම.
* කාර්ලේ ලෙන විශිෂ්‍ය නිර්මාණයක් වීම.විහාර බිත්ති පවා සියුම් කැටයමින් අලංකාර කොට තිබීම. විහාරය ඇතුළට වන්නට පර්වතය හාරා කුඩා ස්ථූප නිමවා තිබීම.
* ස්ථූප ඉදිකිරී - අමරාවතී ස්ථූපයට නව අංග එකතු කිරීම. සාංචි ස්ථූපයේ වාහල්කඩ කැටයමින් නිර්මාණය කිරීම. අලුතෙන් ස්ථූප රාශියක් ඉදි කිරීම.
* මූර්ති හා චිත්‍ර කලාව - ලෙන් විහාරවල විවිධ චිත්‍ර හා මූර්ති දක්නට ලැබීමත බුද්ධ රූප චිත්‍රයට නැගීම.
අජන්තා අංක 10 ලෙන් විහාරය - නාගර්ජුනකොන්ඩ, අජන්තා ලෙන්වල ඇති චිත්‍රවල බෞද්ධකතා වස්තු හා බුද්ධ චරිතයේ ඇතැම් අවස්ථා නිරූපණය කොටතිබීම.
* මෙම චිත්‍රවල රාජකීයන් , කාන්තාවන්, තාපසයන්, කම්කරුවන්, යාචකයන්, ගොවියන් විවධ සතුන් හා වෘක්ෂලතා ආදියනිරූපණය කොට තිබීම.
* නානාභාට්හි ලෙන්වල රජ පවුලේ සාමාජිකයන්ගේ පිළිම නෙලා තිබීම.
උදා : සමුඛ රජුගේ පිළිරුව, පළමුන සාතකර්ණී රජුගේ පිළිරුව, නාගනිකා දේවියගේ පිළිරුව, පළමුවන සාතකර්ණී රජුගේ පුතුන් තිදෙනාගේ පිළිරූ. ආදිය විස්තර කරන්න.

(iii) පාල රාජ වංශයේ සංස්කෘතික කටයුතු ඃ
* ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජයා වීම.
* සසංක රජුගේ ඇවෑමෙන් දුර්වල වූ බෙංගාලයේ පාල වංශික ගෝපාල බලය පිහිටුවීම.
* ධර්මපාල රජු විසින් පාල වංශය යටතේ උතුරු ඉන්දියාවේ රාජ්‍යයක් ගොඩනැගීම.
* ධර්මපාල රජු පරමේශ්වර, පරම භට්ටාරක හා මහා රාජාෂිරාජ යන විරුදාවලින් හැඳින්වීම.
* දේවපාල රජු යටතේ තවදුරටත් අදිරාජ්‍ය ව්‍යාප්තවීම.
* පළමුවන මහීපාල, රාජේන්ද්‍ර චෝල හමුවේ පරාජයටපත්වීමත් සමගපාල රාජවංශයේ අවසානය සිදුවීම.
* මෙම පාලකයන් විසින් සංස්කෘත සේවාවන් රැසක් සිදුකිරීම.
* පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දැක්වීම.
* ගෝපාල රජු නාලන්දාවේ විහාරයක් ඉදිකිරීම.
* වික්‍රමශීලා, ඕදන්තපුරි ඇතුළු බෞද්ධ අධ්‍යාපන ආයතන 50 කට වඩි සංඛ්‍යාවක් ඉදිකිරීම.
* අටීස නම් භික්ෂුව ටිබෙටයට ධර්ම ධූත මෙහෙවරට යැවීම.
* අග්නිදිග ආසියාවේ ශ්‍රී විජය අධිරාජයා සමග බෞද්ධ සම්බන්ධතා පැවැත්වීම.
* මෙලෙස මහායාන බුදු දහමේ ප්‍රබෝදය ටිබෙටයේ සහ ගිණිකොණදිගආසියාවේ ප්‍රචලිත වීම.
* ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම.
* පාලයන්ගේ කැටයම් හා මූර්ති ශිල්පය ශ්‍රී ලංකාව, නේපාලය, තිබ්බතය, බුරුමය, ඉන්දු චීනය, හා ඉන්දුනීසියාව යනරටවල කලා ශිල්ප කෙරෙහි බලපෑම.
* සංස්කෘත සාහිත්‍යයෙ දියුණුව * බෙංගාලි භාෂාවේ සම්භවය.
* හින්දු ආගමට අනුග්‍රහ දක්වමින් දේවාලඉදි කිරීම ආදිය විස්තර කරන්න.

(iv) **<u>II චන්ද්‍රගුප්ත රජු ඃ</u>**
* මෙතුමා පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍ර ඃ
මථුරා ටැම් ලිපිය, උදයගිරි ගුහා ලිපිය, ගඩවා ශිලා ලිපිය, සාංචි ලේඛනය, මෙහෙරවුලි ටැම් ලිපිය.
* දේවි චන්ද්‍රගුප්ත නාට්‍යයට අනුව සමුද්‍රගුප්තගෙන් පසු රාමගුප්ත නැමැත්තෙකු රජ වූ බව. එහෙත් කාසි, සංජන තඹ තහඩුව හා අභිලේඛන මගින් දෙවන චන්ද්‍රගුප්ත නායකත්වයට පත්වී බව.
* දේවගුප්ත, වික්‍රමාදිත්‍ය, දේව ශ්‍රී, පරමභට්ටාරක යන විරුදයන් භාවිතා කිරීම හා ධ්‍රැවදේවිය හා කුවේරනාගා යන බිසෝවරු වූහ.
* මෙතුමාගේ කාලයේදී චීන දේශාටන පාහියං භික්ෂුව ඉන්දියාවට පැමිණ වසර 10ක් පමණ ඉන්දියාවේ ජීවත්වීම.
* රන්, රිදී හා තඹ කාසි නිකුත් කරමින් සිය බලය වඩාත් ඉස්මතු කිරීම.
* ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීම සඳහා මෙතුමා දිග් විජය ප්‍රතිපත්ති 2ක් අනුගමනය කිරීම.
* දිග් විජය ප්‍රතිපත්ති මගින් බටහිර ඉන්දියාවේ ශක ශත්‍රප බලය බිඳ දැමීම.
* විවාහ සම්බන්ධතා මගින් අධිරාජ්‍ය විශාල කිරීම. නාග වංශික කුවේරනාගා කුමරියවිවාහ කර ගැනීම. ඇගෙන් ලැබුනු ප්‍රබාවතී ගුප්තා නම්දුවත් වාකාටක රජෙකු වූ දෙවන රුද්‍රසේනට විවාහ කරදීම.
* කදම්භ වංශික පාලක කාකුස්ථිවර්මන් රජුගේ දුවක ගුප්ත පාලකයන්ට විවාහ කරදීම. එම රජු II චන්ද්‍රගුප්ත රජු යැයි අනුමාන කෙරේ.
* මොහුගේ පාලන සමයේ කාසි නිකුත් කිරීම.
* අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතුවල විශාල දියුණුවක් ඇතිවීම. මෙතුමාගේ රාජ්‍ය සභාවේ නවරත්න නමින් කවින් සිටි බව සඳහන් වීම. ආදිය විස්තර කරන්න.

(එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)